# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 29 දරන ගොවිජන පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 7 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 මැයි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 45 යි | තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1981 අංක 29 දරන ගොවිජන පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 7 වන දින]

**එල්. ඩී.—ඕ. 17/80.**

**1972 අංක 5 දරන ගොවිජන පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 29 දරන ගොවිජන පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1972 අංක 5 දරන ගොවිජන පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනතේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1972 අංක 5 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

'(1) ආයතනයට පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන, (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක මණ්ඩලයක් තිබිය යුතු ය:—

(අ) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා; ඔහු පාලක මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය;

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්, එනම්:—

(i) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු;

(ii) ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු;

(iii) ඉඩම් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු;

(iv) ජාතික ක්‍රම සම්පාදන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු;

(v) ප්‍රාදේශීය සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු;

(vi) ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු;

2—ඒ 54705—11, 550 (81/01)

(vii) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(viii) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(ix) මහවැලි සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(x) අභ්‍යන්තර වෙළෙඳාම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(xi) ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජිතයකු ; සහ

(xii) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ නියෝජිතයකු :

එසේ වුව ද මේ ඡේදයේ (i) සිට (x) දක්වා වූ අනුඡේදවල සඳහන් විෂයයන් දෙකක් හෝ ඊට වැඩි ගණනක් එක් අමාත්‍යවරයකුට පවරන ලද හෝ එක් අමාත්‍යවරයකු භාරයේ පවත්නා අවස්ථාවක, ඒ විෂයයන් පිළිබඳ අමාත්‍යවරයා විසින් එක් නියෝජිතයකු පමණක් නම් කළ යුතු ය ; තවද

(ඇ) පහත සඳහන් වන නිල බලයෙන් සාමාජිකයන් :—

(i) ආයතනයේ අධ්‍යක්ෂවරයා ;

(ii) කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(iii) ඉඩම් කොමසාරිස්වරයා හෝ ඔහුගේ නාමිකයා ;

(iv) ගොවිජන සේවා කොමසාරිස්වරයා හෝ ඔහුගේ නාමිකයා ;

(v) වාරිමාර්ග අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(vi) සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයා හෝ ඔහුගේ නාමිකයා ;

(vii) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(viii) ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ දේශීය නියෝජිතයා හෝ ඔහුගේ නාමිකයා.' ; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය.

7. 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද යම් සාමාජිකයකුගේ මරණය, ඔහු ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා ඔහු කලින් ධුරය අත් හළහොත් මිස, අවුරුදු තුනක කාලයක් ඔහු ධුරය දැරිය යුතු ය. ".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" ආයතනයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම හා ඔවුන්ගේ වියදම් ආපසු ගෙවීම.

12. රැස්වීම්වලට සහභාගි වීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ආයතනය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් ආයතනයේ සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය. ආයතනයේ රැස්වීම්වලට සහභාගි වීමේ කාර්යය සඳහා හෝ ආයතනය විසින් අනුමත කරනු ලබන සහ ආයතනයේ කටයුතුවලට සම්බන්ධ වෙනත් කාර්ය සඳහා හෝ සාමාජිකයන් විසින් දරනු ලබන යම් ගමන් වියදම්, හෝටල් වියදම් සහ වෙනත් අනියම් වියදම් ද ආයතනය විසින් ඔවුනට ආපසු ගෙවිය යුතු ය. ".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ. :— ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" උපසභාපතිවරයකු පත් කිරීම සහ රැස්වීම්වල දී මූලාසනය දැරීම.

16. (1) අමාත්‍යවරයා විසින් 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන් අතුරෙන් උපසභාපතිවරයකු සභාපතිවරයා විමසා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) සභාපතිවරයා විසින් හෝ ඔහු නොමැති විටක දී, උපසභාපතිවරයා විසින් මණ්ඩලයේ රැස්වීම්වල දී මූලාසනය දැරිය යුතු අතර, සභාපතිවරයා සහ උපසභාපතිවරයා යන දෙදෙනාම මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණ නොමැති විටක පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් කෙනකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීමක දී තීරණය කිරීමට තිබෙන යම් කරුණක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඡන්ද සමතාවක් ඇති වූ අවස්ථාවක, ඒ රැස්වීමේ සභාපතිවරයාට, තම ඡන්දයට අතිරේකව, දෙවන හෝ තීරක ඡන්දයක් තිබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියෙහි (3) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3අ) විනය හේතූන් නොවන හේතූන් මත (3) වන උප වගන්තිය යටතේ අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් කරනු ලැබූ යම් තැනැත්තකු, 19 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කවර අවස්ථාවක වුව ද ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරන ලද තැනැත්තකු වන විටක—

(අ) රැකියාව අහිමිවීම වෙනුවෙන් වන්දි වශයෙන් මාස හයක වැටුප් ඔහුට ගෙවිය යුතු ය ; තවද

(ආ) ඔහු ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේ දී, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ ප්‍රදානයකට ඔහු සුදුසුකම් ලැබ සිටියේ නම්, එවිට ඒ ප්‍රදානයේ කාර්යය සඳහා, ආයතනයේ කාර්ය මණ්ඩලයෙහි ඔහුගේ සේවා නියුක්තිය, ඔහු විසින් දරන ලද අධ්‍යක්ෂ තනතුර අහෝසි කිරීමේ හේතුව මත අවසන් කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.